# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 160/43 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාදා — 1975.04.19**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (50)/75.

**මහජන ආරක්ෂක ආඥාපනත (40 වන අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව, මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1975 අප්‍රේල් මස 19 වන දින,
නුවරඑළිය,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**නියෝග**

1. මේ නියෝග 1975 අංක 4 දරන හදිසි අවස්ථා (හමුද සමාන අභ්‍යාස සංවිධානය කිරීම තහනම් කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිම තැනැත්තකු විසින් පොදු ස්ථානයක හෝ පෞද්ගලික ස්ථානයක හෝ යම්කිසි සරඹ පුහුණුවක් හෝ හමුද අභ්‍යාස යක් හෝ ඊට සමාන අභ්‍යාසයක් සංවිධානය කිරීම හෝ පවත්වා ගෙන යාම හෝ ඊට සහභාගිවීම, එම සරඹ පුහුණුව හෝ අභ්‍යාසය පවත්වනු ලබන ප්‍රදේශයේ පොලිස් අධිකාරිවරයා විසින් ඒ සඳහා නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් මගින් ඒ සරඹ පුහුණුවට හෝ අභ්‍යාසයට විශේෂයෙන් ම බලය දී ඇති අවස්ථාවක මිස, නොකළ යුතුය.

3. මේ නියෝග—

(අ) සන්නද්ධ සේවාවල සාමාජිකයන් ; හෝ

(ආ) පොලිස් හමුදවේ සාමාජිකයන් ; හෝ

(ඇ) යම් සරඹ පුහුණුවක් හෝ අභ්‍යාසයක් පැවැත්වීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු විසින් පොදුවේ හෝ විශේෂයෙන් බලය දෙනු ලැබ ඇත්නම්, යම් පාසලක ප්‍රධානයා විසින් ඒ පාසලේ භූමියෙහි ඒ පාසලේ හෝ වෙනත් යම් පාසලක ශිෂ්‍යයන් සඳහා සංවිධානය කරනු ලැබූ හෝ අවසර දෙනු ලැබූ ඒ සරඹ පුහුණුව හෝ අභ්‍යාසය

සම්බන්ධයෙන් අදළ නොවන්නේ ය.

4. මේ නියෝගයේ විධිවිධාන කිසිවක් කඩ කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකකට නොවැඩි කාලයක් බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් පන් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

5. මේ නියෝගවල—

(අ) " සරඹ පුහුණුව " යන්නට—

(i) සමූහ වශයෙන් හෝ පෙළ ගැසී හෝ ගමන් කිරීම ;

(ii) හමුද හෝ හමුදවලට සමාන සමූහවලට හෝ පෙළ ගැසීම්වලට සංවිධානය වීමට පුද්ගලයන් පුහුණු කිරීම හෝ ඔවුන්ට හමුද හෝ හමුදවලට සමාන සමූහවලට හෝ පෙළ ගැසීම්වලට සංවිධානය වීම හැකිවන හෝ පහසුවන ආකාරයේ පුහුණුවක් පුද්ගලයන්ට ලබා දීම ; සහ

(iii) සන්නද්ධ වූ හෝ සන්නද්ධ නොවූ සටන්වලට පුද්ගලයන් පුහුණු කිරීම

ඇතුළත් වේ ; තව ද

(ආ) " පාසල " යන්නෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිගන්නා ලද පාසලක් අදහස් වේ.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

115A—ඒ 13668—2,100 (75/04)